පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2022

| ශ්‍රේණිය |
|---|
| 11 |

විෂයය :- නාට්‍ය හා රංග කලාව I , II

පාසලේ නම : ..............................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය - 03 යි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

- **පහත කවි හා ගීත ඛණ්ඩ ඇසුරින් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A – නැත පියාණෙනි කිසිදු මන දොළ
සමා වුව මැන දොසක් වී නම්
වෙසෙන සඳ මේ පාලු ලෙන තුල
නෙක් දිසා සිත පියාඹා යයි

B – ගම්භිර තෙදැති කොන්ස්තන් තීනු පුරේ - තොන්ස්තන් තීනු පුරේ
පුරවර්ධන කරන අණ නර නාමේ මං

C – ගෙදර ගොහින් මක් කරම්ද
දිග තලක කොහොම යන්නේ
ගෙදර තමයි ඉන්න වෙන්නෙ
පාරේ බැහැලා කොහොම යන්නේ

D – අත්තක පිපි මලක් ලෙසේ
පෙත්තක ඇදි ඉරක් ලෙසේ
සන්තක මගෙ පුතුගෙ යසේ
නෙත් දෙක හැර බලන් මෙසේ

E – සත් සියක් කපු මල් රැගෙන මම
සත් සියක් සුදු කෙඳි රැගෙන මම
සත් සියක් කපු පිළි වියන මම
සත් සියක් දෙන පළඳිතේ

01. දේශීය ශාන්ති කර්මයකට අයත් පද්‍යයක් වන්නේ,
    1. *A* 2. *D* 3. *E* 4. *C*

02. සෝමලතා සුබසිංහ මහත්මියගේ නාට්‍ය නිර්මාණයකට අයත් ගීත ඛණ්ඩය වන්නේ,
    1. *B* 2. *A* 3. *C* 4. *E*

03. කරලිය රංග භූමිය කරගත් නාටකයකට අයත් ගීත ඛණ්ඩය දැක්වෙන්නේ,
    1. *B* 2. *A* 3. *D* 4. *C*

04. මහාචාර්ය සරච්චන්ද්‍රයන් නිෂ්පාදනය කරන ලද නාට්‍යයකට අයත් ගීත ඛණ්ඩය වන්නේ,
    1. *E* 2. *D* 3. *C* 4. *A*

05. හෙන්රි ජයසේනයන්ගේ නාට්‍ය නිර්මාණයක එන ගීත ඛණ්ඩය වන්නේ,
    1. *A* 2. *E* 3. *B* 4. *C*

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. 'නෘත්ත' යන්නට අදාළ වන්නේ,
    1. කිසියම් අර්ථයක් හැඟවෙන තාලාන්විත නැටුමකි.
    2. ශිව පාර්වති, රාමා සිතා කතා නිරූපණය කිරීමයි
    3. භාව ප්‍රකාශනයෙන් තොර තාලාන්විත නර්තනයයි.
    4. කිසියම් අර්ථයක් හෝ භාවයක් නිරූපණය කිරීමයි.

07. නාට්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,
   1. මිනිස් ක්‍රියාවන් අනුකරණය කර දැක්වීමයි.
   2. රංග භූමි අලංකරණය සඳහා පසුතල යොදා ගැනීමයි
   3. නර්තන සහ සංගීතය භාවිතයට ගැනීමයි
   4. ජීවමාන සංගීතය භාවිතයට ගැනීමයි

08. ප්‍රාසාංගික කලාවේ සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,
   1. සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වීම.
   2. රංගනය, නර්තනය, චලනය පදනම් වූ සජීවී කලාවක් වීම.
   3. චිත්‍රපට ටෙලි නාට්‍ය ආදිය ප්‍රාසාංගික කලා යටතට අයත් වේ.
   4. ස්ථාන, ක්‍රියා නිරූපණය සඳහා චිත්‍ර වස්ත්‍ර යොදා ගැනීම.

09. නාට්‍ය කලාව අනෙකුත් කලාවන් ගෙන් වෙනස් වන්නේ,
   1. වේදිකාව සහ අංගරචනය යොදා ගන්නා බැවිනි
   2. රංගාලෝකය සහ ගගණිකාව යොදා ගන්නා බැවිනි.
   3. පසුතල නිර්මාණ සහ චිත්‍ර වස්ත්‍ර යොදා ගන්නා බැවිනි.
   4. සතර අභිනය යොදා ගනිමින් රංගය සිදු කරන බැවිනි.

10. නළුවරණය මගින් සිදු කළ යුත්තේ,
   1. මනා කඩවසම් රූමත් නළු නිළියන් තෝරා ගැනීමයි.
   2. චරිත වලට ගැලපෙන අය පමණක් තෝරා ගැනීමයි.
   3. නිෂ්පාදකගේ හිතවත්කම මත නළු නිළියන් තෝරා ගැනීමයි.
   4. ගායන හා නර්තන හැකියා සහිත නළු නිළියන් තෝරා ගැනීමයි.

11. නාට්‍යමය අවස්ථාවක පැවතිය යුතු ලක්ෂණයක් වන්නේ,
   1. කිසියම් ගැටුමක්, දෙගිඩියාවක් සහිතව නිර්මාණය වීම.
   2. කිසියම් කතා පුවතක් ඒ අයුරින්ම නිර්මාණය වීම.
   3. කතා පුවතේ ඇති චරිතවල හැඟීම් නිරූපණය කිරීම.
   4. කතා පුවතක් රසවත්ව නිරූපණය කිරීම.

12. ක්ෂණික නිරූපණ මගින්,
   1. සංවේදන හැකියාව දියුණු කරගත හැකිය.
   2. පරිකල්පන හැකියාව දියුණු කර ගත හැකිය.
   3. ගායන හැකියාව වර්ධනය කර ගත හැකිය.
   4. කථන හැකියාව දියුණු කරගත හැකිය.

13. රංග වින්‍යාසය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශනය තෝරන්න.
   1. ආනුෂාංගික කලා සංයෝජනයෙන් තොරව නළු නිළි චලන සකස් කිරීම.
   2. නළු නිළියන්ට අවශ්‍ය පරිදි චලන හා රිද්ම පෙළ ගැස්වීම.
   3. වේදිකා පාලකට අවශ්‍ය පරිදි තර්කානුකූලව චලන පෙළ ගැස්වීම.
   4. නළු නිළි චලනයක් තර්කානුකූලවත් තාලාන්විත හෝ රිද්මයානුකූලව පෙළ ගැස්වීම.

14. වර්තමානයේ භාවිතා නොවන රංගාලෝක උපකරණය වන්නේ,
   1. යොමු පහන   2. කිට්සන් පහන   3. ධාරා පහන   4 වර්ණ චක්‍රය

15. රංගාලෝකයේ දී බහු වර්ණ ලබා ගැනීම සඳහා වර්ණ චක්‍රය සවිකරන්නේ,
   1. යොමු පහන ඉදිරියෙනි   2. ධාරා පහන ඉදිරියෙනි
   3. අල්ට්‍රා වයලට් පහන ඉදිරියෙනි   4. ආලෝක බුබුළු පහන ඉදිරියෙනි

16. නාට්‍යයකට සංගීතය අවශ්‍ය වන්නේ,
   1. සංවාද අතර ඇති නිහඬ බව නැති කිරීම සඳහාය
   2. ජවනිකා අතර වෙන් කිරීම් සිදු කිරීමටය.
   3. කතාවේ ඒකාකාරී බව නැති කිරීම සඳහාය.
   4. නාට්‍යයේ ඒ ඒ අවස්ථා තීව්‍ර කර දැක්වීම සඳහාය.

- **අංක 17 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

අ) ඌරු වේෂයක් මවාගත් රාහු අසුරේන්ද්‍රයා මලය රජුගේ උයන පාළු කරන්නට විය. උයන්පල්ලෝ ඒ බව රජුට සැල කරන ලදි.

ආ) විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිසුන් ඇත.

ඇ) පීකොක්, ත්‍රීරෝස්, බ්‍රිස්ටල්, නන්දසේන ............ පොඩි අප්පුහාමි ............ ජන්දෙට ජන්දෙට කරන්න ගිහින් තමයි මට වැරදුනේ.

ඈ) සොරකමට සැක කරනු ලබන රාමා මරාදමා පැන යාමට තැත් කරන හෙට්ටියා අල්ලා ඔහු ලවාම රාමාට පණ ඉපද්දවීම.

17. ඉහත 'අ' ප්‍රකාශය අයත් ශාන්ති කර්මය හා එම සිද්ධියට අදාල චරිතය වන්නේ,
   1. කිරිමඩුව හා මංගර කුමරු
   2. පූනා මඩුව හා සංඛපාල රජු
   3. කොහොඹා කංකාරිය හා පඩුවස්දෙව් රජු
   4. පහන් මඩුව හා සේරමාන් රජු

18. 'ආ' ප්‍රකාශය කවුරුන් විසින් කාහට පවසන ලද්දක්ද?
   1. භික්ෂුව විසින් ගදුහ යක්ෂයාට
   2. භික්ෂුව විසින් දේව දූතයාට
   3. නාගසේන ස්ථවිර විසින් මිලිඳු රජුට
   4. ආලවක විසින් ගදුහ යක්ෂයාට

19. 'ඇ' සංවාද ඛණ්ඩය අයත් නාට්‍යමය ජවනිකාව වන්නේ,
   1. වඩිග පටුන
   2. රාමා මැරීම
   3. නානු මුරය
   4. සූනියම් යාක්ෂණියගේ පැමිණීම

20. 'ඇ' හි සඳහන් අර්ථය සම්බන්ධ ශාන්ති කර්මය වන්නේ,
   1. ගම්මඩුව
   2. කොහොඹා කංකාරිය
   3. සූනියම් යාගය
   4. සන්නියකුම

- **පහත දැක්වෙන වගුව ඇසුරෙන් 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයාගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක/අනුවර්තන |
|---|---|---|---|
| ද ෆාදර් | $A$ | පීතෘ | ප්‍රේමරංජිත් තිලකරත්න |
| ද රෙස්පෙක්ටබල් ප්‍රොස්ටිටියුට් | ෂෝන්පෝල් සාත්‍රෙ | $B$ | උදය මල්ලවආරච්චි |
| $C$ | හෙන්රික් ඉබ්සන් | සයුරෙන් ආ ලද | සුනන්ද මහේන්ද්‍ර |
| ද එල්ඩර් සන් | ඇලෙක්සැන්ඩර් වම්පිලෝව් | පුත්‍ර සමාගම | $D$ |
| ඇන්ටිගනී | $E$ | ඇන්ටිගනි | ආරියවංශ රණවීර |

21. ඉහත වගුවේ '$A$' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
   1. සැමුවෙල් බෙකට්
   2. සොෆොක්ලීස්
   3. ඔගස්ට් ස්ට්‍රින්බර්ග්
   4. ඇන්ටන් චෙකොෆ්

22. ඉහත '$B$' කොටුවට අයත් පරිවර්තන නාට්‍යයේ නම කුමක්ද?
   1. වැනිසියේ වෙළෙන්දා
   2. නම්බුකාර අභිසරු ලිය
   3. හරිම බඩු හයක්
   4. සකල ජන

23. ඉහත වගුවේ '$C$' කොටුවට අයත් නාට්‍යයේ නම කුමක්ද?
   1. ලේඩි ෆොම් ද සී
   2. ද ත්‍රී පෙනි ඔපෙරා
   3. ද පබ්ලික් එනිමි
   4. ද ලෝවර් ඩෙප්ත්ස්

24. ඉහත වගුවේ '$D$' කොටුවට අයත් පරිවර්තකගේ නම කුමක්ද?
   1. සුගතපාල ද සිල්වා
   2. රංජිත් ධර්මකීර්ති
   3. ආරියවංශ රණවීර
   4. ප්‍රසන්න විතානගේ

25. ඉහත වගුවේ '$E$' කොටුවට අයත් රචකයාගේ නම කුමක්ද?
   1. බර්ටෝල් බ්‍රෙෂ්ට්
   2. හෙන්රික් ඉබ්සන්
   3. සොෆොක්ලිස්
   4. ප්ලෝටස්

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් අංක 25 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


E


F


G


H


I

26. "අම්මයි පුතයි" වේදිකා නාට්‍යයෙන් රංගනයට අවතීර්ණ වූ රංගන ශිල්පියා වන්නේ,
   1. $E$ ය
   2. $G$ ය
   3. $I$ ය
   4. $H$

27. වීදි නාට්‍ය ක්ෂේත්‍රයෙන් රංගනයට අවතීර්ණ වුයේ,
1. $F$ ය 2. $H$ ය 3. $G$ ය 4. $E$ ය

28. 'ලිහිණි' නාට්‍යයේ මොලිගේ චරිතය රංගනයෙන් සම්මානයට පාත්‍ර වුයේ,
1. $F$ ය 2. $E$ ය 3. $I$ ය 4. $G$ ය

29. තලමල පිපිලා, පරාස්ස ආදි නාට්‍යයන්හි විශිෂ්ට රංගන දායකත්වයක් දැක්වුයේ,
1. $I$ ය 2. $F$ ය 3. $E$ ය 4. $H$ ය

30. මධුර ජවනිකා නාට්‍යයේ රංගනයේ යෙදුණු රංගධරයෙකි,
1. $G$ ය 2. $H$ ය 3. $E$ ය 4. $F$ ය

- **පහත වගුව ආශ්‍රයෙන් 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| ක | ට | ත | ද |
|---|---|---|---|
| වෙදරාල<br>පරයා<br>සොත්තානා | බහුබූතයා<br>සෙල්ලම්ලමා<br>හඬ දූතයින් | වඩිග බමුණා<br>ඔඩ්ඩිස ඍෂිවරයා<br>වසවතු | සංඛපාල රජු<br>සූනියම් යක්ෂණිය<br>මහාකෝල සන්නියකා |

31. ඉහත වගුවේ 'ක' අක්ෂරයෙන් දැක්වෙන චරිත හා සම්බන්ධ වන්නේ,
1. සොකරි 2. කෝලම් 3. නාඩගම් 4. නූර්ති

32. ඉහත වගුවේ 'ද' අක්ෂරයෙන් දැක්වෙන චරිත හා සම්බන්ධ වන්නේ,
1. රටයකුම 2. සූනියම් යාගය
3. දහඅට සන්නිය 4. කොහොඹා කංකාරිය

33. ඉහත වගුවේ 'ට' අක්ෂරයේ දැක්වෙන චරිත හා සම්බන්ධ වන්නේ,
1. නූර්ති 2. සොකරි 3. කෝලම් 4. නාඩගම්

34. ඉහත වගුවේ 'ත' අක්ෂයේ දැක්වෙන චරිත හා සම්බන්ධ වන්නේ,
1. සූනියම් යාගය 2. නානු මුරය 3. කපුයක්කාරිය 4. සන්නියකුම

35. ඉහත වගුවේ ශාන්ති කර්මයන්ට අයත් චරිත හා සම්බන්ධ වන්නේ,
1. ක, ට 2. ට, ත 3. ත, ද 4. ත, ද

- **නිවැරදි පිළිතුර සපයන්න.**

36. රංග අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් නළුවාට අත්පත් කර ගත නොහැකි ගුණාංගයකි.
1. පරිකල්පන හැකියාව වර්ධනය වීම 2. සබකෝලය වර්ධනය වීම
3. පෞරුෂය වර්ධනය වීම 4. සාමූහිකත්වය වර්ධනය වීම

37. අංග රචනයේදී වඩාත් සැලකිය යුතු වන්නේ,
1. නාට්‍ය ප්‍රභේදයයි 2. ප්‍රේක්ෂාවයි
3. රූමත් බවයි 4. ශෛලියයි

38. මිනර්වා නාට්‍ය බිහි කිරීමේ පුරෝගාමියා වුයේ,
1. චාල්ස් ඩයස් 2. සී. දොන් බස්තියන්
3. බී.ජී.ඩබ්. ජයමාන්න 4. සිරිසේන විමලවීර

39. නූතන තරගකාරී අධ්‍යාපනය බොහෝ යෞවනයන්ගේ ජිවිත ඛේදවාචකයක් බවට පත් කර ඇති අයුරු ප්‍රකාශ කිරීමට විකෘති නාට්‍යයේ ප්‍රධාන වශයෙන් යොදාගෙන ඇති චරිත වන්නේ,
1. සම්පත්, ප්‍රියංගනි, සරණපාල 2. ප්‍රියංගනි, ජගත්, සරණපාල
3. ජගත්, ප්‍රියංගනි, ස්වදේශ 4. විදේශ, සරණපාල, ප්‍රියංගනි

40. විකෘති නාට්‍යය රචනා කිරීමේ අරමුණ වුයේ,
1. ශ්‍රී ලාංකීය යෞවනයන් විඳින පීඩාව පෙන්වීම සඳහා වේදිකා නාට්‍ය මාධ්‍ය කර ගැනීමටය.
2. වැඩිහිටියන්ගේ අපේක්ෂා ඉටු කිරීම සඳහා බාල පරපුර කැපවන ආකාරය පෙන්නුම් කිරීමය.
3. වෛද්‍ය විද්‍යාල සඳහා ඇතුලත් වීමට නොහැකි දරුවන්ගේ කතාව කීමටය
4. දරුවන් විභාග සමත් වී දෙමාපියන් සතුටු කිරීමට ගන්නා උත්සාහය පිළිඹිබු කිරීමටය.

(1×40=40)

## නාට්‍ය හා රංග කලාව II

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. දික්තල කාලගෝල නාට්‍යයේ තේමාව කුමක්ද? (ල.02)
   ii. දික්තල කාලගෝල නාට්‍යය අයත් සම්ප්‍රදාය සහ ශෛලිය නම් කරන්න. (ල.02)
   iii. දික්තල කාලගෝල නාට්‍යය දෙවන නිෂ්පාදිත වර්ෂය නම් කරන්න. (ල.02)
   iv. මෙම නාට්‍යයේ සංගිතය සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩ 04 ක් නම් කරන්න. (ල.02)
   v. දික්තල කාලගෝල යන දෙදෙනා එකිනෙකාට නොගැළපිමට හේතු දෙකක් නම් කරන්න. (ල.02)
   vi. මෙම නාට්‍යයේ නඩුව අවසානයේ කාලගෝල ඉල්ලා සිටින දෙවැනි ඉල්ලීම ඉටුකළ නොහැකි යැයි මහෞෂධ පණ්ඩිතයන් පවසන්නේ ඇයි? (ල.02)

02. i. පහතරට සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම දෙකක් නම් කරන්න. (ල.02)
   ii. එම ශාන්ති කර්ම දෙකෙහි නාට්‍යමය ජවනිකා දෙක බැගින් ලියන්න. (ල.04)
   iii. එයින් එක් ශාන්ති කර්මයක එන නාට්‍යමය ජවනිකා තුළ ඇති නාට්‍යමය ලක්‍ෂණ උදාහරණ සහිතව පහදන්න. (ල.06)

03. i. නාට්‍යයක් ගොඩනැංවීමේ කාර්යයේ ප්‍රමුඛයා වන්නේ කවරෙක්ද? (ල.02)
   ii. නළු වරණයක් සිදු කරන ක්‍රමවේද දෙකක් ලියන්න. (ල.04)
   iii. නාට්‍යයක් වේදිකා ගත කිරිමේ කාර්යයේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල අනුපිළිවෙලින් විස්තර කරන්න. (ල.06)

04. i. නාට්‍යයක වේෂ භූෂණ යනු මොනවාද? (ල.02)
   ii. වේෂ භූෂණ ශිල්පියා වේෂ භූෂණ නිර්මාණයේදි සැලකිලිමත් විය යුතු කරුණු හතරක් නම් කරන්න. (ල.04)
   iii. නළුවෙකුට හෝ නිළියකට සමාරෝප කාර්යයේදි වේෂ භූෂණ වැදගත් වන ආකාරය පහදන්න. (ල.06)

05. i. ''කෝලම්'' යන්නෙහි අර්ථය දක්වා කෝලම් ප්‍රචලිත ප්‍රදේශ 02 ක් නම් කරන්න. (ල.02)
   ii. කෝලම් ජන නාටකයේ එන පූර්ව රංගය හා අපර රංගය පිළිබඳව කෙටියෙන් පහදන්න. (ල.04)
   iii. කෝලම් රංග ශෛලිය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල.06)

06.



   i. මෙම ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු නම් කරන්න. (ල.02)
   ii. ඔහු විසින් අධ්‍යක්‍ෂණය කළ ලෝක ධර්මී නාට්‍ය 04 ක් නම් කරන්න. (ල.04)
   iii. ඔහු නාට්‍ය කලාවට සිදු කල මෙහෙය අගයන්න. (ල.06)

07. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකිය.

කසුනි ඉගෙනිමෙහි ඉතා දක්‍ෂ ශිෂ්‍යාවකි. එහෙත් ඇයගේ ආර්ථික තත්වය නිතරම ඇයගේ ඉගෙනීමට බාධාවක් විය. ඇයගේ මව කුලී වැඩ කරන්නේ ඇයගේ ඉගෙනීම් කටයුතු වලට සහයක් වීමේ අරමුණිනි. කුඩාකලම ඇගේ පියාගේ වියෝව ඇගේ ගමනට මහත් බාධාවක් විය. හදිසියේම මව රෝගාතුර වේ. ඇගේ සියළු කටයුතු අඩාල වී ඉතා අමාරු තත්වයක ඇය සිටින විට ඇගේ පියා කියාගත් පුද්ගලයෙක් ඔවුන්ගේ නිවසට පැමිණේ ......... එවිට .............

   i. රංග විධාන සහිතව සංවාද ගොඩ නගාගෙන තිබීම. (ල. 04)
   ii. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩ නගා ගැනීම සඳහා (ල. 04)
   iii. නොසිතු පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ල. 04)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න